**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල පොත්වල වටිනාකම රු.54,655 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කඩ කුලී ආදායම රු.6,212ක් අඩුවෙන් දක්වා තිබුණි. | එම | එම |
| (ඇ) | කරුවලගස්වැව කාර්යාල රැස්වීම් ශාලාවේ වටිනාකම රු.793,384ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම | එම |
| (ඈ) | ජර්නල් වවුචර් 05 මගින් තැන්පත් ගිණුමේ රු.27,500ක ආදායම ඉවත් කිරීම සඳහා තැන්පත් ගිණුම හර කර සමුච්චිත අරමුදලට බැර කරනවා වෙනුවට සමුච්චිත අරමුදල හර කර ණයගැතියෝ බැර කර තිබුණි. | එම | එම |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ හිටි ජල බදු ශේෂය රු.2,538,720ක් වූ අතර උප ලේඛන අනුව රු.2,542,087ක් වූයෙන් රු.3,367ක වෙනසක් විය. | ඉදිරියේ දී මෙම කටයුතු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,767,461 ක් වටිනා ගිණුම් ශේෂ 04 ක්, භෞතික පැවැත්ම, උපලේඛන සහ ඊට අදාළ අනෙකුත් සාක්ෂි නොතිබීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | මේ සම්බන්ධ කිසිදු තොරතුරක් සභාව සතුව නොපවතින බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කළ හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම. | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ.571 | වසර 02ක් ඉක්මවූ තැන්පතු 07ක් නියාදනය කර නොතිබුණි. | වසර 02 ක් ඉක්මවූ අදායමට ගෙන නොතිබූ තැන්පතු සම්බන්ධයෙන් සොයාබලා ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,791,535ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,788,308ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 8,797 | 8,452 | 5,116 | 3,159 | 9,111 | 8,090 | 5,043 | 3,513 |
| කුලී | 4,303 | 2,137 | 1,936 | 1,240 | 4,955 | 3,112 | 1,987 | 1,310 |
| බලපත්‍ර ගාස්තු | 179 | 73 | 73 | - | 165 | 64 | - | - |
| වෙනත් ආදායම් | 34,407 | 36,691 | 36,691 | 1,023 | 12,754 | 6,364 | 6,364 | - |
| එකතුව | 47,686 | 47,353 | 43,816 | 5,422 | 26,985 | 17,630 | 13,394 | 4,823 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු.620,738 ක්, ජල බදු රු.2,542,087 ක් සහ කුලී රු.1,239,679 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (ප්‍රජා ජල සම්පාදන) යටතේ කරුවලගස්වැව සියඹලාව ජල ව්‍යාපෘතියේ ජල ටැංකිය ඉදිකිරීම සඳහා රු.2,713,219ක් වැය කර තිබූ අතර ජල නල සම්බන්ධතාවය ලබා නොදීම හේතුවෙන් එහි ප්‍රතිලාභ මහජනතාව අතට පත් කිරීමට නොහැකි වී තිබුණි. | දැනට පවතින නල පද්ධතිය මඟින් අතුරු නලයක් සම්බන්ධ කර බෙදාහැරීම සිදුකරගෙන යෑමට උපදෙස් ලබා දී ඇති බව. | ජල ටැංකිය සඳහා ජල නල සම්බන්ධතාවය ලබා දීමට කඩිනමින් කටයුතු කල යුතුය. |
| (ආ) | ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ රු.1,470,000ක් වැය කර තබ්බෝව ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් කටයුතු නිම කර තිබූ නමුත් එහි ප්‍රතිලාභ මහජනතාව අතට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | එහි අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වන බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වරින් වර දැනුවත් කර ඇති බව. | ඉදිකිරීම් අවසන් කළ පසු කඩිනමින් භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නාත්තණ්ඩිය ඉතිරි කිරීම් බැංකු ශාඛාවේ රු.74,426 ක මුදලක් නිශ්ක්‍රීයව පැවතුණි. | ඉදිරි වැඩකටයුතු සිදුකිරීමට කටයුතු කරන බව. | ගිණුම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ගිණුම්වල වටිනාකම රු.6,703,491ක් වූ අතර ඒ තුල වර්ෂ 03ක් ඉක්ම වූ ශේෂවල වටිනාකම රු.625,415ක් විය.මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දි අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.8,719,311ක් වූ අතර ඉන් අවුරුදු 03කට වැඩි රු.1,280,351ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දි නිරවුල් කිරිමට කටයුතු කරන බව. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් වර්ෂ 05කට වරක් වරිපනම් බදු ප්‍රතිශෝධනයක් කළ යුතු වුවත් සභා බල ප්‍රදේශය තුල 2015 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව මත 2022 වර්ෂයටද වරිපනම් බදු අයකර තිබුණි. | වරිපනම් තක්සේරුවක් සඳහා කටයුතු කරන බව. | යාවත්කාලීන තක්සේරුවකට අනුව ආදායම් අයකර ගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැදගම ළමා උද්‍යානය බොහෝ කාලයක සිට භාවිතා නොකිරීම හේතුවෙන් අධික ලෙස කැළෑවෙන් වැසී තිබිම නිසා එහි ඇති ක්‍රීඩා උපකරණවලට ස්වාභාවික උපද්‍රවවලින් හානි සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | ළමා උද්‍යානය පෙරපාසලට පැවරීම සඳහා අදාළ කටයුතු සිදුකරන බව. | නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කල යුතුය. |
| (ආ) | සභාව සතුව රු. 21,198,384ක් වටිනාකමැති වත්කම් 04ක් නිශ්ක්‍රීයව පැවතුණි. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.<br>. | පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ක්‍රමවේද සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු දේපල 65ක නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | ඉදිරියේදී පවරා ගැනිම සඳහා කටයුතු කරන බව. | අදාළ දේපළ පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තෘතික තනතුරු 01ක් ද ද්වීතික තනතුරු 08ක් ද හා ප්‍රාථමික තනතුරු 06ක් ද පුරප්පාඩු වී තිබුණි. | පවතින සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගැනිමට ඉදිරියේදී කටයුතු කරන බව. | සභාවට අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හඳුනා ගෙන එම සේවක ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු ෆෝටෝන් ට්‍රැක්ටරය, මෝටර් ග්‍රේඩරය හා බැකෝ ලෝඩරය යන වාහන ධාවනය නොකර ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ ගාල් කර තිබුණි. | අලුත්වැඩියා කිරීමෙන් හා ටයර් සපයා ගැනීමෙන් අනතුරුව ධාවනය සඳහා යොමු කිරීමට කටයුතු කරන බව. | වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු ජීප් රථය සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 10ක් ඉටු කිරීම සඳහා රු.341,465ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | ඉන්ධන අර්බුදය හේතුවෙන් අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කර නිමවුම් මට්ටම අත්පත් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කර්තව්‍යයන් 36ක් සඳහා රු.35,626,000ක ප්‍රතිපාදන සලසා තිබුණද අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන කර්තව්‍යයන් 36ක් අත්හැර දමා තිබුණි. | ආදායම් නොලැබීම හේතුවෙන් ඉටුකර ගැනිමට නොහැකි වූ බව. | අයවැය ගත කාර්යයන් අදාළ ප්‍රතිපාදන යොදවාගෙන නිම කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණද එම විගණන සැලැස්මට අනුව විගණන කටයුතු සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබූ අතර 2022 වර්ෂය සඳහා විගණන වාර්තා නිකුත් කර නොතිබුණි. | මෙවැනි අතපසුවීම් සිදු නොවන ලෙස කටයුතු කරන බව. | වැදගත් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විගණනය සැලසුම් කර විගණන කටයුතු සිදු කළ යුතුය. |